ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**පුවත්පත් නිවේදනය**

## SLINEX – 2018 ඒකාබද්ධ යුධ අභ්‍යාසය සඳහා ඉන්දීය නාවික හමුදා නෞකා සහ ගුවන් යානා පැමිණේ

ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ඉන්දීය නාවික හමුදාව අතර ඒකාබද්ධ යුධ අභ්‍යාසය (SLINEX – 2018) 2018 සැප්තැම්බර් 7 වන දින සිට 13 වන දින දක්වා ත්‍රිකුණාමලයේදී පැවැත්වේ. මෙතෙක් කලක් සෑම වසර දෙකකටම වරක් පැවති මෙම යුධ අභ්‍යාසය මෙම වසරේ සිට වාර්ෂිකව පැවත්වෙනු ඇත. සාගර කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාවය වර්ධනය කරගැනීමට සහ දෙරටෙහි නාවික හමුදාවන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය සහ තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන කටයුතු ශක්තිමත් කිරීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දක්වන උනන්දුව මෙමගින් පෙන්නුම් කෙරේ. දෙරටෙහි නාවික හමුදා නෞකාවන් නිරන්තරයෙන්ම පාහේ දෙරට අතර සංචාරයන් සිදු කරන අතර මෙම අභ්‍යාසය ඉන්දීය සහ ශ්‍රී ලංකා නාවික හමුදාවන් අතර අන්තර් ක්‍රියාකාරකම් තවදුරටත් ඉහළ නංවා ගැනීමට ඉවහල් වනු ඇත.

SLINEX 2017 යුධ අභ්‍යාසය පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේදී විශාඛාපට්නම් හි පැවති අතර ඒ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා දෙකක් සහභාගී විය. මෙම වසරේදී අභ්‍යාසයේ විෂයපථය සැලකිය යුතු ලෙස පුළුල් වී ඇති අතර ඒ සඳහා ඉන්දියාව නියෝජනය කරමින් නෞකා තුනක්, සාගරය ආශ්‍රිත මුර සංචාර ගුවන් යානා දෙකක් සහ හෙලිකප්ටර් යානාවක් සහභාගී වේ. එසේම ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයන්ද ප්‍රථම වරට මෙම අභ්‍යාසය සඳහා එක් වේ. මෙය වරාය අදියර සහ මුහුදු අදියර යනුවෙන් අදියර දෙකක් යටතේ සිදු කෙරේ. දින හයක් පුරා පැවැත්වෙන මෙම අභ්‍යාසයට ඒකාබද්ධ හමුදා පුහුණු, වෘත්තීමය දේශන, විශේෂඥ දැනුම හුවමාරු කරගැනීම, හෙලිකොප්ටර් සහ සාගර මුර සංචාර ගුවන්යානා මෙහෙයුම්, අවි පුහුණු, සෙවීම් සහ මුදාගැනීම්, නාවික ශාස්ත්‍රය සහ සාගර යුධ උපායන් පිළිබඳ පුහුණුව යනාදිය ඇතුළත් වේ. සාගර මුර සංචාර සිදු

කිරීම සහ ඵලදායි EEZ අවේක්ෂණ සහ මුදවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ පුහුණුව ලබා දීම සඳහා ඉන්දීය නාවික හමුදා, ශ්‍රී ලංකා නාවික හමුදා සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා හට පිරිස් වලින් සමන්විත Dornier ගුවන්යානය වීන වරායෙන් ගුවන්ගත කිරීම මෙම අභ්‍යාසයේ කැපී පෙනෙන අවස්ථාවක් වනු ඇත.

ක්‍රීඩා වැඩසටහන් සහ සංස්කෘතික අංගයන්ද මෙම අභ්‍යාසයට ඇතුළත් වන අතර ඒ තුළින් දෙරටෙහි නාවික හමුදාවන්ට එකිනෙකාගෙන් ඉගෙන ගැනීමටද, පොදු වටිනාකම් ශක්තිමත් කරගැනීමටද එකිනෙකා අතර මිත්‍ර සබඳතා ගොඩනගා ගැනීමටද අවස්ථාව උදා කර දෙනු ඇත.

*****

2018 සැප්තැම්බර් 06

කොළඹ